ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 6 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2005

වාණිජ නීතිය – LWU 3324 / 4324

කාලය - පැය තුනයි

---

දිනය: 2006 අප්‍රේල් මස 24 වන දින　　වේලාව: ප. ව. 1.30 සිට ප.ව. 4.30 දක්වා

---

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න
අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

1. 'ඉඩම' සමාගමේ අධ්‍යක්ෂකවරයෙකු වන රොෂාන් ජන රැකුම රක්ෂණ සමාගම සමග ජීවිත රක්ෂණ ගිවිසුමකට ඇතුලත් විය. රක්ෂණ යෝජනා ආකෘති පත්‍රය සම්පූර්ණකොට අත්සන් කරන අවස්ථාවේ දී පහත දක්වා ඇති ආකාරයට එහි සඳහන් වූ ප්‍රශ්නවලට රොෂාන් පිළිතුරු දුන්නේය.

   (1) මීට පෙර වෙනත් රක්ෂණ සමාගම් වෙත ඉදිරිපත්කරන ලද යෝජනා පත්‍ර පිළිබඳ තොරතුරු සපයන්න. එසේ ඉදිරිපත් කර ඇත්නම් සාමාන්‍ය ශාස්තු ප්‍රමාණයන්ට අනුව ඒවා ප්‍රතිග්‍රහණය කර ඇත් ද? <u>**පිළිතුර:**</u> නැත.

   (2) පසුගිය වසර 5 තුල දී යෝජනාකරු යම් කායික වෛද්‍යවරයෙකුගෙන් ප්‍රතිකාර ගෙන ඇත්නම් ඒ පිළිබඳ විස්තර ඉදිරිපත් කරන්න. <u>**පිළිතුර:**</u> නැත.

   (3) යෝජනාකරු කිසියම් අපරාධ වරදකට වරදකරු වී ඇත්නම් ඒ පිළිබඳ තොරතුරු සපයන්න. <u>**පිළිතුර:**</u> නැත.

මෙම ප්‍රශ්නවලට අමතරව සාමාන්‍යයෙන් මෙවැනි යෝජනා පත්‍රයක අන්තර්ගත වන්නා වූ සම්මත ආකෘතියේ වගකීම බැහැර කිරීමේ සාමාන්‍ය වගන්ති සහ කොන්දේසි ඇතුලත් විය.

කෙසේ වුව ද රක්ෂණ සමාගම් තුනක් විසින් රොෂාන්ගේ යෝජනා පත්‍ර මීට පෙර ප්‍රතික්ෂේප කර ඇති බවත් අවුරුදු දෙකකට පෙර රොෂාන් විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෙකුව සිටිය දී වෛරස් උණ රෝගයක් සඳහා විශ්වවිද්‍යාලයීය වෛද්‍යවරයාගෙන් ප්‍රතිජීවක ඖෂධ ලබාගෙන තිබූ බවත් ජන රැකුම රක්ෂණ සමාගමට දැනගන්නට ලැබුණි. තව ද පදවිය ගම්මානයේ සන්නිවේදන පහසුකම් සපයන වෙළඳ ආයතනයක සේවිකාවකට තර්ජනය කිරීම සම්බන්ධයෙන් රොෂාන් වරදකරු වී ඇති බව ද සමාගමට දැන ගන්නට ලැබුණි.

ජන රැකුම සමාගම ඔබේ උපදෙස් පතයි. සමාගමට උපදෙස් දෙන්න.

2. "කුලී සින්නක්කර ගිවිසුමක් භාණ්ඩ විකිණීමේ ගිවිසුමකින් සැලකිය යුතු ප්‍රමාණයකට වෙනස් වේ."

ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් මෙම ප්‍රකාශයේ වලංගුභාවය කෙටියෙන් සාකච්ඡා කරන්න.

3. එක්කෝ

කුඩා කුකුලු ගොවිපලක් පවත්වාගෙන යන ගෘහණියක වන උම්මා සිය පවුල නඩත්තු කිරීම සඳහා අසල කුඩා වෙළඳ සැලකට බිත්තර විකුණයි. සති අන්ත පුවත්පතක පළ වූ දැන්වීමක් දුටු උම්මා හුන්කා සමාගමට දුරකථනයෙන් කථාකොට කුකුලු ආහාර වගයක් ඇණවුම් කළාය. අවාසනාවකට මෙන් කුකුලු කෑමවලට කෘමිනාශක මිශ්‍ර වී තිබීම නිසා ඒවා ආහාරයට ගත් උම්මාගේ කිකිළියන් සියල්ල මිය ගියහ.

(අ) උම්මාට උපදෙස් දෙන්න.

(ආ) තමන් විසින් සපයනු ලබන භාණ්ඩවල ඇති දෝෂ සම්බන්ධයෙන් හුන්කා සමාගම වග නොකියන බව සඳහන් ලේඛනයකට උම්මා අත්සන් කර තිබුනේ නම් ඔබේ පිළිතුර වෙනස් වන්නේ ද?

නැතහොත්

"විශ්වාසයෙන් යුතුව විභාගවලට මුහුණ දෙන්නේ කෙසේ ද" නම් වූ ග්‍රන්ථයේ කතුවරිය වූ උම්මා එහි පිටපත් 300 ක් හුන්කා ප්‍රකාශන සමාගම වෙත භාර දුන්නේ වට්ටමක් සහිතව විකිණීම සඳහා හෝ ආපසු භාර එවීමේ පදනම මතයි. කෙසේ වුව ද හුන්කා සමාගම විසින් කෙටි කාලීන ණයක් ලබා ගැනීම සඳහා උම්මාගේ පොත් තොගය ද ඇතුලුව හුන්කා ප්‍රකාශකයින්ගේ සියලුම පොත් තොගය ඇපයක් ලෙස තබා ඇති බව උම්මාට දැනගන්නට ලැබුණි.

(අ) උම්මාට උපදෙස් දෙන්න.

(ආ) උම්මා විසින් භාර දෙන ලද පොත් තොගය හුන්කා සමාගම විසින් ණයක් සඳහා ඇපයක් වශයෙන් තබා නොතිබුණ ද ඒවා ආපසු එවීමට දන්වා තිබූ කාලය ද ඉක්මවා තම ගබඩාවේ රඳවා තබා තිබුණේ නම් ඔබේ පිළිතුර වෙනස් වන්නේ ද?

4. අදාල අවස්ථාවන් හි දී විනිශ්චිත නඩු තීන්දු හා ව්‍යවස්ථාපිත විධිවිධාන කෙරෙහි අවධානය යොමු කරමින් පහත සඳහන් ඒවායින් ඕනෑම දෙකක් සංසන්දනය කර වෙනස්කම් දක්වන්න

(අ) විනිමය බිල්පතක් සහ චෙක් පතක්
(ආ) යථාකාලීන ධාරක සහ වටිනාකමේ ධාරක
(ආ) චෙක්පතක් සහ පොරොන්දු නෝට්ටුවක්

5. "හිමිකරුවකු නොවන තැනැත්තකු විසින් භාණ්ඩයක් විකුණන විට සහ අයිතිකරුගේ අධිකාරය හෝ කැමැත්ත ඇතිව භාණ්ඩ භාණ්ඩ නොවිකුණන විට විකුණුම්කරුට තිබුනාට වඩා හොඳ හිමිකමක් ගැණුම්කරුට නොලැබේ."

විමසන්න.

6. පහත සඳහන් අවස්ථාවන්හි නෛතික තත්ත්වය කෙටියෙන් සාකච්ඡා කරන්න.

(අ) පෙරේරා ඩිලාන්ගෙන් රු 25000/- ක මුදලක් ණයට ලබාගෙන ඇත. ණය මුදල ගෙවිය යුතු කාලය පැමිණිවිට ඩිලාන්ගේ නමට රු 25000/- ක චෙක්පත් නිකුත් කරවා ගැනීම සඳහා පෙරේරා සිල්වා පෙළඹවිය. කෙසේ වුව ද චෙක්පත මුදල් කිරීමට පෙර සිල්වා විසින් ගෙවීම අත්හිටුවන ලදී.

(ආ) කමල්ගේ නමට ලියන ලද චෙක්පතක් කමල් විසින් හිස් පිටසන යොදනු ලැබූ පසු සොරකම් කරන ලදී. පසුව මෙම චෙක්පත දරන්නාට බැංකුවේ කවුන්ටරයෙන් මුදල් ගෙවන ලදී.

(ඇ) 'ගනුදෙනු කළ නොහැක' යනුවෙන් රේඛනය කරන ලද හිස් චෙක්පතක් සැකසූ ගුණදාස මුදල සහ ගෙවීම ලබන්නාගේ නම සඳහන් කිරීම පිණිස එය තම ලිපිකරුට භාර දුන්නේය. කෙසේ වුව ද ගුණදාසගේ අවසර නොමැතිව වැඩිපුර මුදලක් චෙක් පතෙහි සටහන් කළ ලිපිකරු තමා විසින් සුසිල්ට ගෙවිය යුතු ණයක් පියවීම සඳහා එම චෙක්පත සුසිල්ට භාර දුන්නේය.

7. අදාල අවස්ථාවන් හි දී විනිශ්චිත නඩු තීන්දු හා ව්‍යවස්ථාපිත විධිවිධාන කෙරෙහි අවධානය යොමු කරමින් පහත සඳහන් ඒවායින් මාතෘකා දෙකක ඇඟවීම් මොනවාදැ යි සාකච්ඡා කරන්න.

(අ) පුනරාදේශය
(ආ) භාණ්ඩ විකිණීමේ ගිවිසුමක අන්තර්ගත වන්නා වූ අසාධාරණ ගිවිසුම් නියම
(ඇ) බිල්පතක පිටසන
(ඈ) භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් කඩකිරීම සම්බන්ධයෙන් ඇති ප්‍රතිකර්ම

8. පහත සඳහන් මාතෘකා දෙකක් පිළිබඳ සටහන් ලියන්න.

(අ) 2003 අංක 9 දරණ පාරිභෝගික ආරක්ෂණ අධිකාරි පණත
(ආ) 1980 අංක 26 දරණ ආහාර පණත
(ඇ) භාණ්ඩ භාරදීම
(ඈ) බිලපතක් නිදහස් කිරීම

හිමිකම් ඇවිරිණි
***********